# වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

## 01. කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයට අයත් යාන්ත්‍රික අධිකාරි තනතුර (ස්ථිර)

**පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු (යාන්ත්‍රික) විද්‍යා උපාධිය ලබා තිබීම

**තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්**

- උපාධි සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තුවක / සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික වාණිජ ආයතනයක එක් අවුරුදු සේවා පළපුරුද්දක් ලබා තිබීම.
- වයස අවුරුදු 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අය විය යුතුය.
- ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**තනතුරට අදාළ වැටුප් පරිමාණය**

- JM 1-1 42,600- 10x755-18x1,135 -70,580

## 02. කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයට අයත් කාර්මික සහකාර තනතුර(ස්ථිර)

**පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**අධ්‍යාපන සුදුසුකම්**

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුලුව විෂයන් හතරකට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින්(06) සමත් වී තිබීම.
- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා අංශයෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

**තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්**

- කළමනාකරණ සහකාර (තාක්ෂණ) තනතුරෙහි තමාට පවරා ඇති කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ (05) මට්ටමට අඩු නොවන්නාවූ මෝටර් රථ අලුත්වැඩියා, යන්ත්‍ර ශිල්පය, මෝටර් රථ විදුලි ශිල්පය හා වායු සමීකරණය කිරීම.

  පින්තාරු ශිල්පය හා තහඩු ශිල්පය, කම්මල් ශිල්පය යන ක්ෂේත්‍රයන්ට අදළව තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.
- වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු 35 ට නොවැඩි අය විය යුතුය.
- ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික, මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**තනතුරට අදාළ වැටුප් පරිමාණය**

- MA 2-2-30,310-10x300-7x350-4x600-20x710-52,360

## 03. ප්‍රාථමික ශිල්පීය සේවා ගණයට අයත් කාර්මික, තහඩුකරු, බර යන්ත්‍ර ක්‍රියාකරු, රියදුරු (ස්ථිර)

**කාර්මික - පුරප්පාඩු - 04**

**අධ්‍යාපන සුදුසුකම්**

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය.

**තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්**

- වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හී සිව්වන (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම හා අදළ ක්ෂේත්‍රයෙහි එක් වසරක සේවා පළපුරුද්ද.

**බර යන්ත්‍ර ක්‍රියාකරු - පුරප්පාඩු සංඛ්‍යාව -04, රියදුරු - පුරප්පාඩු සංඛ්‍යාව - 05**

**අධ්‍යාපන සුදුසුකම්**

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය.

**තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්**

- බර යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව ජාතික ආධුනිකත්ව හා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරිය විසින් හෝ ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය විසින් නිකුත් කල ජාතික වෘත්තීය කුසලතා සිව්වැනි (04) මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකය ලබා තිබීම හා සහතිකය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදල ක්ෂේත්‍රයේ වසර තුනක (03) ක පළපුරුද්ද ලබා තිබීම.
- රියදුරු තනතුර සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කල A කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රය හා අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබීම.
- වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අය විය යුතුය.
- ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික, මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**වැටුප් පරිමාණය**

- PL -03 - 26,290-10X270-10X300-10X330-12X350-39,490

## 04. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් උදව්කරු/සේදුම්කරු

**අධ්‍යාපන සුදුසුකම්**

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය.

**තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්**

- වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අය විය යුතුය.
- ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**තනතුරට අදාළ වැටුප් පරිමාණය**

- PL -01 – 24,750-10X250-10X270-7X300-15X330-37,000

**සැයු - ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් 2025.02.12 දිනට ප්‍රථම "කළමණාකාර අධ්‍යක්ෂ,වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය, අංක 95, දකුණු රවුම්පාර, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.**

**කළමනාකාර අධ්‍යක්ෂ,**

**දුරකථන අංකය- 037-2222538**